ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவு செலவுத் திட்டத் திணைக்களம்
DEPARTMENT OF NATIONAL BUDGET
මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
பொதுத் திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை.
General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka.
Web Site : www.treasury.gov.lk
e-mail : budget@nbd.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No. : BD/GPS /130/9/14/MC-II
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2015.07.07

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

දිස්ත්‍රික් ලේකම්තුමනි/තුමියනි

**2014 /2015 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා යතුරුපැදි ලබා දීම පොදු උපදෙස්**

උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ අංක 2/2014 අයවැය චක්‍ර ලේඛය සහ 2014.09.30, 2014.11.13 හා 2015.02.12 දිනැති උපදෙස් ලිපි වලට අමතර වශයෙනි.

**02. යතුරු පැදිය සඳහා වෙළඳ පොළ වටිනාකම ගෙවීම**

2014.11.13 දිනැති උපදෙස් ලිපියෙහි (8) වන වගන්තිය යටතේ, ක්ෂේත්‍ර නිළධාරියකු යතුරු පැදි හිමි නොවන තනතුරකට මාරු වීම, සේවයෙන් ඉවත් වීම, සේවය අත්හිටුවීම, නියමිත කාලයට පෙර විශ්‍රාම යාම වැනි අවස්ථාවලදී මෙම දෙපාර්තමේන්තුවේ 2015.02.12 ලිපියට අදාළව වෙළඳ පොළ වටිනාකම (යතුරු පැදියක් සඳහා රු.194,920/- ක් සහ ස්කූටරයක් සඳහා රු.183,500/- ක මුදල) එකවර ගෙවිය යුතුය. එහිදී, නිළධාරියා විසින් යතුරුපැදි සඳහා ගෙවා ඇති රු.50,000/- හෝ ස්කූටරයක් සඳහා ගෙවා ඇති රු.45,000/- මුදල අඩුකර ඉතිරි ප්‍රමාණය (යතුරු පැදියක් සඳහා රු.144,920/- ක් සහ ස්කූටරයක් සඳහා රු.138,500/-) චෙක්පතකින්, අදාළ දිස්ත්‍රික් ලේකම් හෝ අදාළ ආයතනය (පළාත් පාලන අමාත්‍යාංශය,පොලිස් දෙපාර්තමේන්තු,බන්ධනාගාර දෙපාර්තමේන්තුව,මහවැලි අධිකාරිය) මගින්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

දැනට මෙම ක්‍රමය යටතේ අය කිරීම් කර එකී මුදල් රජයේ ආදායමට බැර කර ඇත්නම්, එම මුදල් බැර කරනු ලැබූ ගිණුමෙන් ආපසු ලබාගෙන (භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතිය ගෙන) අදාළ දිස්ත්‍රික් ලේකම් හෝ ආයතනය මගින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත චෙක්පතකින් එවිය යුතුය.

එසේම, ඉහත පරිදි වෙළඳ පොළ වටිනාකම ගෙවා ඇති යතුරුපැදියෙහි තොරතුරු මූල්‍ය කල්බදු ගෙවීම් ලේඛනයෙන් ඉවත් කිරීමට, අදාළ මූල්‍යායතනයට සහ මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට දැනුම් දීම සඳහා එයට අදාළ ලිපි ලේඛන වල සහතික කල පිටපත් සති දෙකක් ඇතුලත ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. (යතුරු පැදිය ලියාපදිංචි කිරීමේ සහතිකය, මුදල් භාරගැනීමේ කුවිතාන්සි පිටපත්, යතුරුපැදියෙහි වටිනාකම ආපසු ගෙවීමට හේතු වූ කරුණු ඇතුලත් ලිපි ලේඛනවල සහතික කල පිටපත්)

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General : 0094-11-2484665, 0094-11-2484639(Fax)
කාර්යාලය / அலுவலகம் / Office : 0094-11-2484669, 0094-11-2484853
ෆැක්ස් අංකය / தொலைநகல் இல / Fax No. : 0094-11-2484807

03. **යතුරුපැදිය/ස්කූටරය රක්ෂණය කිරීම**

සියළුම යතුරුපැදි සහ ස්කූටර් සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගත යුතු අතර මේ සම්බන්ධයෙන් 2014.09.30 දින ලබා දී ඇති උපදෙස් වල ඇතුලත් ජාතික රක්ෂණ භාර අරමුදලට අමතරව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ද අදාළ රක්ෂණ ආවරණය ලබා ගැනීම කල හැකිය.

04. අයවැය යෝජනා අනුව ක්‍රියාත්මක වන මෙම වැඩසටහන සාර්ථක කර ගැනිමට ඔබගෙන් ලැබෙන සහයෝගය බෙහෙවින් අගය කරමි.

මෙයට - විශ්වාසී

ඒ.ආර්.දේශප්‍රිය
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. අමාත්‍යාංශ ලේකම්වරුන්
2. පළාත් සහ ප්‍රධාන ලේකම්වරුන්
3. අධ්‍යක්ෂ ජනරාල් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව
4. සාමාන්‍යාධිකාරී,අබාන්ස් ඔටෝ පුද්. සමාගම
5. සාමාන්‍යාධිකාරී,ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම
6. විගණකාධිපති

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவு செலவுத் திட்டத் திணைக்களம்
**DEPARTMENT OF NATIONAL BUDGET**

මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
பொதுத் திறைசேரி, நிதி, திட்டமிடல் அமைச்சு, கொழும்பு 01, இலங்கை.
General Treasury, Ministry of Finance and Planning, Colombo 01, Sri Lanka.

**Web Site** : www.treasury.gov.lk **e-mail** : budget@nbd.treasury.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | BD/GPS/130/9/14/MC-Tem-1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015.02.12 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

දිස්ත්‍රික් ලේකම්තුමනි/තුමියනි,

**<u>2014 අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම</u>**
**<u>ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරුපැදි ලබාදීම</u>**

උක්ත වැඩසටහන යටතේ අප දෙපාර්තමේන්තුව විසින් 2014.11.13 දිනැතිව නිකුත් කර ඇති පොදු උපදෙස් අනුව, යතුරුපැදි හිමිකම් ඇති ක්ෂේත්‍ර නිලධාරී තනතුරකින් වෙනත් තනතුරක් සඳහා ස්‍ථයාමුවන නිලධාරීන්ට ඒ සඳහා තවදුරටත් හිමිකම නොලබන බැවින් වෙළඳපොළ වටිනාකම ගෙවා පවරා ගත යුතු බවට උපදෙස් ලබා දී ඇත.

02. ඒ අනුව, රාජ්‍ය සේවයේ යතුරුපැදි හිමි තනතුරකින් ඔවුන් ඉවත්වන අවස්ථාවක දී සැපයුම්කාර සමාගම් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් අනුව තීරණය කර ඇති යතුරුපැදියක වෙළඳපොළ වටිනාකම, යතුරුපැදියක් සඳහා රු.194,920.00/- ක් සහ ස්කූටරයක් සඳහා රු.183,500.00/- ක් වන බව කාරුණිකව දන්වා සිටිමි.

මෙයට - විශ්වාසී

(අත්සන)

ජී.ඩී.සී.ඒකනායක මෙය
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. අමාත්‍යාංශ ලේකම්වරුන්
2. පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
3. විගණකාධිපති

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 0094-11-2484665, 0094-11-2484639 *(Fax)*
කාර්යාලය / அலுவலகம் / Office: 0094-11-2484669, 0094-11-2484853
ෆැක්ස් අංකය / தொலைநகல் இல. / Fax No.: 0094-11-2484807

# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office } 2484500 2484600 2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax } (94)-11 - 2449823

වෙබ් අඩවිය / வெப் சைட் / Website } www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No. } BD/GPS/130/9/14MC

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014.12.18

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන්

**2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**

**ක්ෂේත්‍ර රාජකාරිවල නියැලෙන රාජ්‍ය නිලධාරීන් සඳහා යතුරු පැදි ලබාදීම**

ඉහත අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිකුත් කර ඇති 2/2014 හා 2014.07.23 දිනැති අයවැය චක්‍රලේඛය හා බැඳේ.

02. එම චක්‍රලේඛයේ 4 වන ඡේදය අනුව මෙම හිමිකම නිසා එම නිලධාරී කාණ්ඩ වෙනුවෙන් දැනට අනුමතව ඇති දීමනා වෙනසක් සිදු නොවන බව සඳහන් වුවද, මේ වනවිට සමහර පළාත් සභා, රේඛීය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල මෙම නිලධාරී කාණ්ඩ මෙතෙක් කල් ලැබූ දීමනා අඩු කිරීමට කටයුතු කර ඇති බවට අප වෙත වාර්තා වී තිබේ.

03. මෙම යෝජනා ක්‍රමය යටතේ යතුරුපැදි ලබාදීම මෙම නිලධාරීන්ගේ ප්‍රවාහන දුෂ්කරතාවලට පිළියමක් වශයෙන් සිදුකරන ලද්දක් බැවින්, එය පදනම් කරගනිමින් මෙතෙක් ලබාදෙන ලද දීමනා කපා හැරීමක් සිදුකර ඇත්නම් ඒවා වහාම නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

මෙයට - විශ්වාසී

පී.බී.ජයසුන්දර
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ
ලේකම් සහ භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
5. විගණකාධිපති

# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
# தேசிய வரவு செலவுத் திட்டத் திணைக்களம்
# DEPARTMENT OF NATIONAL BUDGET

මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
பொதுத் திறைசேரி, நிதி, திட்டமிடல் அமைச்சு, கொழும்பு 01, இலங்கை.
General Treasury, Ministry of Finance and Planning, Colombo 01, Sri Lanka.

**Web Site** : www.treasury.gov.lk **e-mail** : budget@nbd.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | BD/GPS/130/9/14/MC/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2014.11. 13 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

දිස්ත්‍රික් ලේකම්තුමනි/තුමියනි,

**2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා**
**යතුරුපැදි / ස්කූටර් ලබාදීම**
**පොදු උපදෙස්**

උක්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ අංක 2/2014 අයවැය චක්‍රලේඛය 2014.07.23 දිනැතිව නිකුත් කර ඇත. ඒ අනුව, මෙම වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන අතර, යතුරුපැදි හිමිකම ඇති ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නම් අදාළ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / පළාත් සභා විසින් දිස්ත්‍රික් මට්ටමින් අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදිය යුතුවේ.

02. මේ සඳහා සුදුසුකම් ලබන නිලධාරී කාණ්ඩ ඇතුලත් නාමලේඛනය භාණ්ඩාගාර වෙබ් අඩවිය www.treasury.gov.lk යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තු පිටුවේ (http:/www.treasury.gov.lk/general-treasury2/national-budget.html) පළකර ඇති අතර, සෑමවිටම එකී ලැයිස්තුව උපයෝගී කරගත යුතුවේ. එම නාමලේඛනයෙහි සඳහන් නොවන තනතුරු කිසිවිටක නිර්දේශ කිරීම සිදු නොකළ යුතු අතර, එවැනි විටක පළමුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගත යුතුවේ.

03. 2014.06.30 දිනට සක්‍රීය සේවයේ නියුතු ක්ෂේත්‍ර රාජකාරී වල නියැලෙන නිලධාරීන් මෙම වැඩසටහන සඳහා සුදුසුකම් ලබන අතර, එම නිලධාරියෙකු යතුරුපැදියක් වෙනුවෙන් රු.50,000/- ක් සහ නිලධාරිනියන් සඳහා රු.45,000/- ක මුදලක් එකවර ගෙවීම අනිවාර්ය වේ. එමෙන්ම, 2014.06.30 දිනට ඉදිරි සේවා කාලය වසරකට අඩු නිලධාරියෙකු (2014.06.30 දින සිට වසරක් ගතවීමට පෙර විශ්‍රාම යාමට නියමිත නිලධාරියෙකු) රු.100,000/-ක මුදලක් ද,නිලධාරිනියක් රු.90,000/- ක මුදලක් ද එකවර ගෙවීමෙන් යතුරුපැදියක්/ස්කූටරයක් ලබා ගැනීමට හිමිකම් ලබනු ඇත. මේ හැර වෙනත් කිසිදු අයකිරීමක් මේ සඳහා නොමැති අතර, එකවර ගෙවිය යුතු ගාස්තුව නම වැටුපෙන් අයකර ගැනීමටද ක්‍රමවේදයක් සකසා නොමැත.

04. මෙම ගෙවීම් ඒකාබද්ධ අරමුදලට බැර වන සේ ආදායම් ශීර්ෂ අංක 20:03:04:00 රාජ්‍ය නිලධාරීන්ට ලබාදෙන යතුරුපැදි සම්බන්ධ ගෙවීම යටතේ රජයට බැර කළයුතුය. එය අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ගෙවීම් කළයුතු අතර, ඒ බව තහවුරු කිරීම සඳහා කුවිතාන්සියේ සහතික කළ පිටපත් අදාළ ලේඛන සමග ඉදිරිපත් කළයුතු වේ. පළාත් සභාවලට සහ වෙනත් ආයතනවලට අනුයුක්ත කර ඇති ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ගෙවීම් අදාළ දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සැළසිය යුතුය.


| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | 0094-11-2484665<br>0094-11-2484639 *(Fax)* | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 0094-11-2484669<br>0094-11-2484853 | ෆැක්ස් අංකය<br>தொலைநகல் இல.<br>Fax No. | 0094-11-2484807 |

මාගේ 2014.09.30 දිනැති ලිපිය අනුව ඔබ වෙත දන්වා ඇති ආදායම් සංකේතාංක 20:03:99:00 යටතේ මෙම වැඩසටහනට අදාලව දැනටමත් මුදල් බැර කර ඇත්නම් එම මුදල්ද මෙම 20:03:04:00 ආදායම් ශීර්ෂ අංකයට බැර කර නිවැරදි කිරීමට කටයුතු කරන්න.

05. මෙම යතුරුපැදියක /ස්කූටරයක අයිතිය අදාල ක්ෂේත්‍ර නිලධාරියාට /නිලධාරිනියට හිමිවන අතර, වසර 05 කාලයක් යන තෙක් විකිණීම, අන්සතු කිරීම හෝ කිසිදු ආකාරයක පැවරීමක් සිදුකිරීමට හිමිකමක් නොමැත.

06. මෙම යතුරුපැදි, වසර 5ක කාලයක් සඳහා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය බැංකුවක් හරහා ලබාගෙන ඇති බැවින්, එම ගෙවීම අවසන් වන තෙක් පළමු වර්ෂ 05 යතුරු ක්ෂේත්‍ර නිලධාරියා අයත් වන අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පලාත් සභාව /ආයතනය විසින් නිලධාරියාගේ සහතික කරන ලද අයදුම් පත, ගෙවීම් කල කුවිතාන්සියේ පිටපතක්, ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇතුළු ලේඛන පවත්වා ගතයුතු වේ.

07. වැඩසටහන ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සිදුකරනු ලබන බැවින්, මේ පිළිබඳ ලිපි ගොනුවක් හෝ ලේඛනයක් පවත්වාගෙන යාම සඳහා යෝග්‍ය නිලධාරියෙකු පත්කර ඔහු/ඇය පිළිබඳ විස්තර (දුරකථන අංකයන් ද ඇතුලත්ව) අප වෙත එවන මෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

08. යම් ක්ෂේත්‍ර නිලධාරියෙක් විසින් ඉහත 3 වන වගන්තිය අනුව සඳහන් ඉදිරි සේවා කාලය ඇතුලත ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස තම තනතුරෙන් බැහැර වන්නේ නම් හෝ ඉවත් වන්නේ නම් යතුරුපැදියක / ස්කූටරයක වෙලඳපොල වටිනාකම රජයට ගෙවා යතුරුපැදිය ලබා ගත යුතුවේ.

09. යතුරුපැදි අයිතිය නිලධාරියා සතුවන බැවින්, නඩත්තු සහ රක්ෂණ ඇතුලත් අනෙකුත් නඩත්තු වියදම් ක්ෂේත්‍ර නිලධාරියා / නිලධාරිනිය විසින් පෞද්ගලිකව දැරිය යුතු අතර, දැනටමත් ක්ෂේත්‍ර නිලධාරි කාණ්ඩ සඳහා අනුමතව ඇති ඉන්ධන, ප්‍රවාහන හෝ වෙනත් දීමනා වේ නම්, එකී දීමනා හැර වෙනත් නව දීමනා කිසිවක් සඳහා මේ යටතේ හිමිකමක් නොලැබෙනු ඇත.

10. යතුරුපැදි / ස්කූටර් ලියාපදිංචියට අවශ්‍ය කටයුතු අදාළ සැපයුම්කාර සමාගම විසින් සිදුකරනු ලබන අතර, ඒ සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් එය ලබාගන්නා අවස්ථාවේදී පහත ලියවිලි ඉදිරිපත් කළයුතුය.

1. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අදාල සමාගම මගින් ලබාදෙන පාරිභෝගික විස්තර පත්‍රිකාව
2. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සඳහා MTA2 අයදුම්පත
3. ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ සහතික කළ පැහැදිලි පිටපතක්
4. එසේ නොමැති නම්, ක්ෂේත්‍ර නිලධාරියාගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය අදාල ග්‍රාම නිලධාරි මහතා සහතික කළ ලියවිල්ලක් ඉදිරිපත් කළයුතු වේ.
5. අයදුම්කරුගේ සහතික කළ ඡායාරූප දෙකක්
6. අයදුම්කරුගේ සේවා හැඳුනුම්පතේ සහතික කළ පිටපතක් හෝ සේවා සහතිකයක්
7. අදාල ගෙවීම් කළ බවට තහවුරු කිරීමට කුවිතාන්සියේ සහතික කළ පිටපතක්
8. ආයතන ප්‍රධානියාගේ / බලය පවරනු ලැබූ නිලධාරියාගේ නිර්දේශ ලිපිය

11. යතුරුපැදි ලියාපදිංචි කිරීමේ අයදුම්පතේ (MTA2) අයදුම්කරුගේ අත්සන තිබෙන ස්ථානයේ එම ක්ෂේත්‍ර නිලධාරියා / නිලධාරිනිය අයත් අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ හෝ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් හෝ බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලියාපදිංචිය නිර්දේශ කළයුතු වේ.

එම නිර්දේශය කිරීමේදී ඉදිරි සේවා කාලය අනුව නියමිත ගෙවීම සිදුකර තිබෙන බව සහ නිලධාරියා මෙම වැඩසටහන යටතේ යතුරුපැදි/ස්කූටර් ලබාගැනීමට හිමිකමක් තිබෙන අයෙකු ද යන්න තහවුරු කරගෙන සෑහීමකට පත්විය යුතුය.

12. මෙම යතුරුපැදි/ස්කූටර් නොපමාව ලියාපදිංචි කර, එහි ලියාපදිංචි අංක, ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නම්, තනතුර, ජාතික හැඳුනුම්පත් අංක, ගෙවීම් කරන ලද කුවිතාන්සියේ අංක ඇතුළත් සාරාංශ ලේඛනයක් ඇමුණුම (1) ආකෘතිය Ms Excel මගින් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

13. දිස්ත්‍රික් මට්ටමින් එකවර යතුරුපැදි/ස්කූටර් විශාල ප්‍රමාණයක් බෙදා දීම සිදු වන හෙයින් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඒ සඳහා අවශ්‍ය සංවිධාන කටයුතු මැනවින් සිදුකරනු ඇතැයි කාරුණිකව අපේක්ෂා කරමි. ඒ සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම්, ආරක්ෂාව, නිලධාරීන් හැසිරවීම වැනි කටයුතු නිම වන තෙක් එම ස්ථානයේ රැඳී සිටීමට මාණ්ඩලික නිලධාරියෙක් අනුයුක්ත කිරීම මෙන්ම රක්ෂණ පහසුකම් ලබාගැනීම, ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දිය යුතු වේ.

14. යතුරුපැදි ලබා ගැනීමට පැමිණෙන නිලධාරීන්ට එය පහසුවෙන් ලබා ගැනීම සඳහා වැඩපිළිවෙලක් අත්‍යවශ්‍ය වන බැවින් ඒ සඳහා එක් එක් දිනවලදී ලබාදෙන නිලධාරී කාණ්ඩ/ප්‍රදේශ/තනතුරු පිළිබඳ හිමිකම්ලාභීන් නිවැරදිව දැනුවත් කිරීම වැදගත් වේ. ඉතා සුළු අවස්ථා කිහිපයකදී යතුරුපැදි මෙන්ම එම වාහන නියෝජිතායතනයේ නිලධාරී මහත්ම මහත්මීන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටළු මෙන්ම යතුරුපැදි ලබා ගැනීමට පැමිණි නිලධාරීන් හසුරුවා ගැනීමේ ද ගැටළු මතු වී ඇති බැවින් ඉදිරියේදී එවැනි ගැටළු ඇති වීම මගහරවාලීම සඳහා මෙම යතුරුපැදි/ස්කූටර් බෙදාදීමට සිදුවන ස්ථානවල හා එම ස්ථානවලට ඇතුළුවන ස්ථානවල ද පොලිස් නිලධාරියෙක් යොදවා නිලධාරීන්ගේ මෙන්ම යතුරුපැදි හා අනෙකුත් දේපලවල ආරක්ෂාව තහවුරු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

15. අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක කෙරෙන මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබ ගෙන් ලැබෙන සහයෝගය බෙහෙවින් අගය කරමි.

මෙයට - විශ්වාසී

ජේ.ඩී.සී.ඒකනායක මෙය
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
2. සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
3. විගණකාධිපති

ඇමුණුම 1

අංකය: ..............................

දිනය: ..................

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල්තුමියනි,

<u>2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා</u>
<u>යතුරුපැදි / ස්කූටර් ලබාදීම</u>

ඇමුණුමෙහි විස්තර සඳහන් යතුරුපැදි සඳහා අයවිය යුතු නියමිත මුදල අයකර උක්ත වැඩසටහන යටතේ එම යතුරුපැදි/ස්කූටර් අදාළ නිලධාරීන් වෙත භාරදුන් බව සහතික කරමි.

දිස්ත්‍රික් ලේකම්

(අත්සන හා නිල මුද්‍රාව)

Annex-1

## Providing Motor Cycle for Field Officers Under Budget Proposal 2014/2015 - Motor Cycle

| S.No. | Name of Officer | N.I.C. No. | Field Officers Category | Name of Ministry/Dept./institutions | Adress & Tel.No. | Chassi No. | Vehicle Registration No. | Payment Receipt No. | Delivery Date |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

Prepared by: - ...............................
(Name & Position)

Checked by:- ...............................
(Name & Position)

Certified: - .........................................
(Name & Position)

Annex-1

# Providing Motor Cycle for Field Officers Under Budget Proposal 2014/2015 - Scooters

| S.No. | Name of Officer | N.I.C. No. | Field Officers Category | Name of Ministry/Dept./institutions | Adress & Tel.No. | Chassi No. | Vehicle Registration No. | Payment Receipt No. | Delivery Date |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

Prepared by: - ...................................
(Name & Position)

Checked by:- ................................
(Name & Position)

Certified: - .......................................
(Name & Position)